# 10 ශ්‍රේණිය
# නර්තනය - දෙවන වාරය

## සන්නිවේදන කාර්යය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම පිළිබඳ තොරතුරු උගනිමු

ඈත අතීතයේ සිටම සන්නිවේදන කාර්යය සඳහා බෙර වාදනය යොදා ගැනීම ජන සමාජය තුළ ප්‍රචලිතව පැවතුණි. ඒ ඒ කාර්යයට උචිත ලෙස පද කොටස් යොදා තිබීම නිසා එක් එක් වාදනයන්හි අනන්‍යතාවය, පණිවුඩය අසන්නාට හොඳින් තේරුම් ගත හැකි විය. වර්තමානයේ පවා විවිධ සමාජ හා ආගමික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා භාණ්ඩ වාදනය යොදා ගැනේ. දේශීය වාදන ශිල්පීන් විවිධ මනෝභාවයන් මතුවන ආකාරයට වාදනයේ යෙදෙන අතර අවස්ථාවට උචිත පරිදි වාදනයේ හඬ පාලනය කිරීමද වාදන උපක්‍රමයක් ලෙස යොදා ගෙන ඇත. එදා සිට අද දක්වා මෙම වාදන කලාව පොදු ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමට සමත් වී තිබීම නිසා මෙහි සාමාජයීය හා ආගමික වශයෙන් ප්‍රබල වටිනාකමක් ඇති බව කිව හැකිය.



**සන්නිවේදන කාර්යය කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකිය.**

සන්නිවේදන කාර්යය

| ආගමික අවශ්‍යතා | සමාජ අවශ්‍යතා |
|---|---|
| ● ගිරිභණ්ඩ පූජා | ● අණ බෙර |
| ● ස්තූප පූජා | ● මළ බෙර |
| ● බෝධි පූජා | ● රණ බෙර |
| ● දළදා පූජා | ● මඟුල් බෙර |
| ● ධාතු නිධානෝත්සව | ● රබන් වාදන |
| ● තේවා වාදන | ● දිය කෙළි |
| ● හේවිසි වාදන | ● දඬ කෙළි |

සැකසුම : **ටී.ඒ.කේ. ගුණසේකර**
ගුරු උපදේශක (නර්තනය)

## ආගමික අවශ්‍යතා සඳහා වාදන භාණ්ඩ යොදා ගැනීම

අතීතයේ මෙන්ම වර්තමානයේදී ද ආගමික අවශ්‍යතා සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගත් අතර එම වාදන තුළින් භක්තිය දනවන ආකාරයෙන් වාදනය කිරීම විශේෂ ලක්ෂණයක් විය. පහත සඳහන් වාද්‍ය භාණ්ඩ බොහෝ ආගමික කටයුතු සඳහා සුලබව යොදා ගැනීම සිරිතකි.

❖ **හේවිසි වාදනය :**

මේ සඳහා දවුල, තම්මැට්ටම, හොරණෑව යොදා ගන්නා අතර ගැටබෙරය, පහතරට බෙරය, හක්ගෙඩිය ආදී වාද්‍ය භාණ්ඩ ද ආගමික උත්සවවලදී යොදා ගන්නා අවස්ථා ඇත.






---

## සමාජ අවශ්‍යතා සඳහා වාදන භාණ්ඩ යොදා ගැනීම

ඈත අතීතයේදී මෙම අවශ්‍යතා ඉටු කිරීම සඳහා භාණ්ඩ වාදනය යොදා ගත් අවස්ථා බොහෝය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

❖ **අණ බෙරය :**

රජුන්ගේ පණිවුඩයක් රට වැසියන්ට දැන ගැනීමට සැලැස්වීම සඳහා අණ බෙරය යොදා ගැනේ.



සැකසුම : **ටී.ඒ.කේ. ගුණසේකර**
ගුරු උපදේශක (නර්තනය)

❖ රණ බෙරය :

රජු ඇතුළු පිරිස යුද්ධය සඳහා යාමේදී හා යුද්ධය ජයග්‍රහණය කොට ආපසු පැමිණීමේදී රණ බෙර වයා ඇත.



❖ මළ බෙර :

අවමංගල කටයුත්තකදී මළ බෙරය වාදනය කෙරේ. එමගින් රටවැසියන්ට ශෝකාන්ත පණිවුඩයක් දැන ගත හැකි වේ. මෙහිදී යොදා ගන්නා දවුල හා තම්මැට්ටම සුදු පිරුවටයකින් වසා වාදනය කිරීම සිරිතකි. මේ නිසා හඬ පාලනයක් සිදු වන අතර කරුණ රසය මෙම වාදනය තුළින් ජනිත වේ.



❖ මඟුල් බෙර :

සුභ කටයුත්තකදී හෝ මංගල උත්සවවලදී යොදා ගනු ලැබේ. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායත්‍රය තුළ පිළිවෙලින් ගැටබෙරය, පහතරට බෙරය සහ දවුල යොදා ගනු ලබයි.



උඩරට සම්ප්‍රදාය



පහතරට සම්ප්‍රදාය



සබරගමු සම්ප්‍රදාය

සැකසුම : **ටී.ඒ.කේ. ගුණසේකර**

ගුරු උපදේශක (නර්තනය)

❖ වද බෙර :

රජුගේ නියමයෙන් මරණ දඬුවම ලැබූ අයෙකු එම දඬුවම සඳහා ගෙන යාමේදී වද බෙර වාදනය කෙරේ. මීට අමතරව පැරණි රජ දවස, දිය කෙළි, දඩ කෙළි ආදීයේදී තූර්ය භාණ්ඩ වාදනය යොදා ගෙන ඇත.

---

ඉහත අවශ්‍යතාවයන්ට අමතරව වර්තමානයේදී



- ✓ **විනෝදාස්වාදය සඳහා පැවැත්වන උත්සව**
- ✓ **සංස්කෘතික උත්සව**
- ✓ **ජාතික උත්සව**
- ✓ **පිළිගැනීමේ උත්සව** සඳහා ද විවිධ ස්වරූපයෙන් වාදන අවස්ථා ඇතුළත් කර තිබීමද අපට දැක ගත හැකිය.

---

<u>**කාර්යය පත්‍රිකාව :**</u>

01. අතීතයේදී සන්නිවේදනය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ වාදනය කළ අවස්ථා නම් කරන්න.
02. එය ආගමික හා සමාජයීය වශයෙන් වර්ග කොට දක්වන්න.
03. වාදනයේදී මනෝභාවයන් මතුවන අවස්ථා දෙකක් නම් කොට එහිදී මතුවන රසභාව කවරේදැයි උදාහරණයක් දෙන්න.
04. සන්නිවේදන කාර්යය සඳහා තූර්යවාදන භාණ්ඩ යොදා ගැනීම පිළිබඳ තොරතුරු සහ පින්තූර ඇතුළත් කරමින් කුඩා පොත් පිංචක් සකස් කරන්න.

---

**************

සැකසුම : **ටී.ඒ.කේ. ගුණසේකර**
ගුරු උපදේශක (නර්තනය)